නිරීක්ෂණය කරලා තියෙනවා. විශේෂයෙන්ම තමන් ගැන පුරසාරම් දෙඩීමක් වගේ දෙයක් පෙනෙන්නට තියෙනවා. මේ කාරණය නිසාවෙන්ම, අද වෙනකොට, මධ්‍යම පංතිය සිරසෙන් අයින් වෙලා තියෙනවා. යම් ආකාරයට දැන උගත්, සමාජ තීරුවක් අද සිරස, ප්‍රතික්ෂේප කරමින් ඉන්නවා. ඇත්තටම, ඒක බරපතල ප්‍රතික්ෂේප කිරීමක්. අද සිරස, වැළඳගන්න කණ්ඩායම පෙන්වන ප්‍රධාන සාධකයක් විදිහට රන්දෙපැය කියන නාට්‍ය හතර අපිට පෙන්වන්න පුළුවන්. ඉතාම දුර්වල මේ නාට්‍ය හතරට තමයි, අද සිරසේ වැඩිම ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් තියෙන්නේ. ඒත්, සිරසට විරුද්ධ කණ්ඩායමට සාපේක්ෂකව, මේ විදිහට සිරස වැළඳගෙන ඉන්න කණ්ඩායම, කිසිම සමාජ ක්‍රියාකාරීත්වයක් මුදාහරින කණ්ඩායමක් නෙමෙයි. ඔවුන් සිරසට එකතු වෙන්නේ, පෞද්ගලිකවමයි. එහෙම නැතුව, ඔවුන් කවදාවත්ම, සිරස, බේරාගැනීමේ සටනක් කරන්න සූදානම් නැහැ. ඒ වගේම මේ තරගයේදී ජනමතයේ විකෘතියක් සිද්ධවුණාය කියන කාරණය ගැන, මීට වඩා වැඩි අවධානයක් අපි යොමු කළ යුතුයි. සුපර් ස්ටාර් වෙයි, කියලා හිතපු කිහිපදෙනෙක්ම අතරමැදදි තරගයෙන්, එළියට විසිවුණා.
සාමාන්‍යයෙන්, ඕනෑම දෙයකදී ජනප්‍රිය කවිද කියන එක දැක්කහම, අවබෝධ වෙනවා. ඒත්, අන්තිමට එයා නෙමෙයි, සුපර් ස්ටාර් වෙන්නේ. ඔබ මතුකරපු දේශපාලන මැදිහත්වීම සිද්ධවුණේ, මෙතැනදි තමයි. මට තේරෙන විදිහට ඒ මැදිහත්වීම, එක අතකින් සිරසට එරෙහි කැරැල්ලක්. එහෙම නැතිව, මේක සුපර් ස්ටාර් තරගය පිළිබඳ ප්‍රශ්නයක් විතරක් නෙමෙයි. මේක සෑහෙන කාලයක් තිස්සේ, දැන උගත් මධ්‍යම පංතිය තුළින් සිරසට එරෙහිව ඇති වුන වෛරය යම් ආකාරයකින් ප්‍රකාශවීමක්. ඒත් මධ්‍යම පංතිය තුළින් සිරසට එරෙහිව ඇතිවුන මේ වෛරය ඔවුන් මුදාහැරියේ යම් ආකාරයක අසාර්තකත්වයකින්. ඒ තුළ මේ වැඩසටහන යම් කූටප්‍රාප්තියකට ලංකරන්න, ඔවුන් තබපු, බලාපොරොත්තු සෑහෙන දුරට බිඳ වැටුණාය කියලා මම හිතනවා. ඒක සිරසට එරෙහිව ඇතිවුණ කැරැල්ලක ප්‍රතිඵලයක්. අවසානවකට, මේ තරගයට ඉදිරිපත් වුණ අය ඒකේ ගොදුරු බවට පත්වුණා. ඒක වෙනම කාරණයක්.




**ඔවුන් දිගටම මාධ්‍ය හසුරුවලා තියෙන ආකරය තුළ ඉතා විශාල උද්දච්චතාවයක් මම පෞද්ගලිකව නිරීක්ෂණය කරලා තියෙනවා. විශේෂයෙන්ම තමන් ගැන පුරසාරම් දෙඩීමක් වගේ දෙයක් පෙනෙන්නට තියෙනවා. මේ කාරණය නිසාවෙන්ම, අද වෙනකොට, මධ්‍යම පංතිය සිරසෙන් අයින් වෙලා තියෙනවා.**

**ප්‍රශ්නය :-** *මම ඇහුවේ, පිටත සිටින පක්ෂ දේශපාලනය, මේ තරගය තුළට රිංගීම පිළිබඳ, ඔබේ අදහසයි.*
**පිළිතුර :-** ඔව්, විශේෂයෙන්ම එ.ජා.ප., ජ.වි.පෙ. හා හෙළ උරුමය හා ඔවුනට සම්බන්ධ මාධ්‍ය මේකට සම්බන්ධ වුන බවක් පෙනෙන්නට තිබුණා. මේ මැදිහත්වීම් තුනම ගත්තට පස්සේ මේක අනවශ්‍ය, මැදිහත්වීමක්, පැහැදිලිවම, මේක වෙන පැත්තක තියෙන ජනප්‍රිය තරගයක්. මේ සංවාදයේදී ජ.වි.පෙ. ට සම්බන්ධ මාධ්‍ය හා ඒ දහරාව ගම පිළිබඳ, භක්තියකින් කථා කරන බවක් පෙනෙන්නට තිබුණා. ඔවුනට දක්ෂතම වැදගත් වුනේ නැති තරම්. කුහක නොවී බලනවා නම් මේ තරගය, තුළ අඩු තරමින් කැපී පෙනෙන, චරිත 03 ක් හිටියාය කියන කාරණය, අපිට අනිවාර්යයෙන්ම පිළිගත්තට සිද්ධ වෙනවා. ඒ ශිහාන් මිහිරංග, දර්ශන හා මලිත් පෙරේරා. මෙයින් ශිහාන්ව ගත්තොත්, ඔහු ජනප්‍රිය තලයේ උඩය යා හැකි පුද්ගලයෙක්. ඊළඟට දර්ශනව ගත්තොත්, ඔහු ශාස්ත්‍රීය නැඹුරුවක් සහිත පුද්ගලයෙක්. ඒ වගේම මලිත්ව ගත්තොත්, ඔහු මේ දෙකේම යම් තුලනයක් පවත්වා ගෙන යන පුද්ගලයෙක්. මේ විදිහට, මේ තරගයේ, කැපී පෙනෙන පුද්ගල චරිත තුන වුනේ මේ තුන්දෙනායි. ඒත් ඒ තුන්දෙනාගෙන් කාටවත්ම සුපර් ස්ටාර් වෙන්න ඉඩක් ලැබුනේ නැහැ. පැහැදිලිවම, කෙනෙකුගේ දක්ෂතා නොසළකා ගම හොඳයි කියන එකට, ගමේ අහිංසක කමට නැත්නම් දුප්පත්කමට අනුකම්පාව දක්වලා මෙවැනි තරගයකදී මැදිහත්වීමක් කරනවා නම්, ඒක අසාධාරණ මැදිහත්වීමක්. මේ වැඩසටහන දේශපාලනිකරණය වීමේදී කලින් කියපු පක්ෂවල නායකකාරකාදින්ගේ තීරණ, මත ඒක සිද්ධවුණාය කියන එක, නම් මම විශ්වාස කරන්නේ නැහැ. ජාතික හෙළ උරුමය, පිළිබඳ කාරණය ගත්තොතින්, මේකට සම්බන්ධ වුණේ. ඊට යාම්තමින් සම්බන්ධ මේ හැඟීමකින් කටයුතු කරන පිරිසක් විතරයි. ඒ වගේම මේ විදිහට, මෙයට මොවුන්ගේ මැදිහත්වීමට තවත් කාරණයක් බලපෑවා. විශේෂයෙන්, ශිහාන් මිහිරංග වෙනුවෙන් යම්, ආකාරයක ඡන්ද ව්‍යාපාරයක්, සමහර කතෝලික කොටස් අතර ගෙන ගියාය කියලා ආරංචි පැතිරුණා. ඒ නිසා ඒකට ප්‍රතික්‍රියාවක් විදිහට මේ අය, මෙහෙම හැසිරුණාය කියලා ගොඩක් අය කියනවා. සිංහල බෞද්ධ ජන සංඛ්‍යාවේ ප්‍රමාණයයි, එයට අද තියෙන සංවිධානාත්මකභාවයයි. එක්ක ගත්තාහම, වෙනත් කණ්ඩායමකට ඒකත් එක්ක තරග කරන්නට තියෙන ඉඩ අඩුයි. ඒ නිසා ඒක එතැන ජයග්‍රහනය කළා. ඒත්, සාමාන්‍යයෙන් මේ විදිහට ජාතිය, ආගම වගේ දේවල් මුල්කරගෙන කුඩා කුඩා දේවල්වලට මැදිහත්වීම් කරන්නේ සුළුතරයයි. බහුතරයට මේ වගේ සිල්ලර දේවල් එක්ක ගණුදෙණුවක් නැහැ. ඒ වගේම ශිහාන් මිහිරංගව, ගත්තොත් එයාගේ පෙනුම ගැන සමහර අයට ලොකු විවේචනයක් තිබුණා. සමහරු එයාව දැක්කේ, පොෂ් මිනිහෙක්, කෝටිපතියෙක් විදිහටයි. ලංකාවේ ග්‍රාමීය සමාජයේ, යම් ඊර්ශ්‍යාවක්, තියෙනවාය කියන එක, අපි අනිවාර්යයෙන්ම, පිළිගත යුතු දෙයත්. මේ ඊර්ෂ්‍යාව නිසා, සමහර අය ඔහුට විරුද්ධ වුණා. ඒක මේ තරගය දේශපාලනිකරණය වීම නිසා සිදුවුන නරක දෙයකට හොඳ උදාහරණයක්.

**ප්‍රශ්නය :-** *මේ වැඩසටහනේදී තම මතය, කෙටි පණිවුඩ හරහා, ප්‍රකාශ කෙරුමේදී, නාගරිකයන් දැඩි සේ ගමට ආදරය කරන වගක් පෙනෙන්නට තිබුණා. මෙතැන තිබුණු දේශපාලනය මොකක්ද?*
**පිළිතුර :-** ඒ විදිහට SMS යවපු කට්ටිය, ග්‍රාමීයව ජීවත් වන අයව, එතරම් තදින් දැකලා තියෙනවාය කියලා මම නම් හිතන්නේ නැහැ. ඔවුන් නාගරික හෝ ගම සුන්දරයි කියලා කල්පනා කරන කණ්ඩායමක්. නගරයේ තියෙන ප්‍රශ්නවලට විසඳුම් ගමේ තියෙනවාය කියලා විශ්වාස කරන කණ්ඩායමක්. මේ නිසා ගමට ආදරයකුත් යම් අනුකම්පාවකුත් මේ පිරිත් තුළ තියෙනවා. ඒ නිසා දේශපාලනික ව්‍යාපාරයක් විදිහට, නැත්නම්, සමාජ ව්‍යාපාරයක් විදියට කල්පනාකර බලලා, ඔවුන් ග්‍රාමීය තරුණයන්ට ඡන්දේ දුන්න වගක් පෙනෙන්නට තියෙනවා. ජ.වි.පෙ. ට සම්බන්ධ පිරිස්, ඔවුන් ග්‍රාමීය නිසා ගමට කරපු මැදිහත්වීම වගේම හෙළ උරුමයට සම්බන්ධ පිරිස්, නාගරිකව ඉඳිමින් ගමට ආදරය කරමින්, කරපු මැදිහත්වීමත් අනිවාර්යයෙන්ම හානිකර මැදිහත්වීමක්. සාමාන්‍යයෙන් නාගරික පිරිස් අතර යම් ආකාරයක කුහකකමක් දකින්නට තියෙනවා. උදාහරණයක් විදිහට ශිහාන්ගේ ඇඳුම් පැළඳුම්, නැත්නම් ඔහුගේ පෙනුම මුල්කර ගෙන ඔහුට විරුද්ධව තම මතය, ප්‍රකාශ කළ උදවිය ගත්තොත්, ඒ අය අඳින්නෙත් අර විදිහටමයි. ඔවුනුත් අර විදිහටම කොණ්ඩේ ජෙල් ගාලා ඉන්නවා. ඒත් ඒ අය තමන්ගේ සහයෝගය දෙන්නේ, ගමක ඉන්න කෙනෙකුට. මේ විදිහට මෙතැන ලොකු කුහකකමක්, පෙනෙන්නට තියෙනවා.

**ප්‍රශ්නය :-** *අවසානයේදී -සුපර් ස්ටාර්" බවට පත්වුණේ, ග්‍රාමීය ප්‍රදේශයකින් පැමිණි, නිර්ප්‍රභූ තරුණයකු වූ අජිත් බණ්ඩාරයි. ඔහුගේ ජයග්‍රහණය, ඔබ කොහොමද දකින්නේ ?*
**පිළිතුර :-** මෙහෙමයි. මට අජිත් සමඟ කිසිම තරහක් නැහැ. ඔහු දක්ෂයෙක්. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒත් පැහැදිලිවම මේ තරගයෙන් ජයග්‍රහණය කළ යුතුව තිබුණේ, ඔහු නෙමෙයි. ශිහාන් මිහිරංග, මලිත් පෙරේරා, අමිල පෙරේරා අතරින් කෙනෙකු -සුපර් ස්ටාර්" විය යුතුව තිබුණා. විශේෂයෙන් අමිල පෙරේරා ව ගත්තොත් ඔහු පෞර්ෂයක් සහිත වෙනස් කටහඬක් තිබුණු කෙනෙක්. නමුත් අවසානයේදී මේ සියළු දක්ෂතාවයන්, ''දුප්පත්කම'' කියන, කාරණයට මකා දමන්න පුළුවන් වුණා. යට කරන්න පුළුවන් වුණා. ඒත් SMS යවලා දුප්පත්කම නැති කරන්න පුළුවන්ය කියලා කව්රු හිතන් ඉන්නවා නම් ඒක මහා මෝඩ, පටු අදහසක්.

**ප්‍රශ්නය :-** *''සුපර් ස්ටාර්'' හි අවසන් වටයට පැමිණුනු තරගකරුවන්ට, හොඳ ඉල්ලුමක් පසුගිය දවස්වල ලංකාවේ මාධ්‍ය වෙළෙඳපොලේ තිබුණා. අඬන කාන්තා චරිතවලට, ෂාරුක් ඛාන්ලට තිබුණු තැන මේ අය, හිමි කර ගත්තා. ඒ ගැන අවසාන වශයෙන් කතා කළොත්...*
**පිළිතුර :-** මෙහෙමයි, සමහර අය මෙහෙම වෙන එක ගැන ලොකු අඳෝනා තියනවා. ඒ ගැන ලොකුවට කරදර වෙනවා. දෙස් දෙවොල් තියනවා. ඒත් මට නම් ඒක ලොකු ප්‍රශ්නයක් නෙමෙයි. ඇත්තටම ඒ අය මාකට් වෙන්නේ ඔවුන්ට මාකට් එකක් තියෙන නිසයි. අද ලංකාවේ තියෙන්නේ, වෙළෙඳපොළක් සහිත සමාජයක්. එතැනදි මිනිස් සම්බන්ධතා වැඩියි. ඒ වගේම ජනමාධ්‍යයත් විශාල දෙයක් කරනවා. ඒ අතරේ යම් පුද්ගලයෙකුට ඉල්ලුමක් තිබුණාහම, එයාව, වෙළෙඳ පොළකරණයවීමත් සිද්ධ වෙනවා. ඒක අද ඊයේ විතරක් නෙමෙයි, ඉස්සරත් වුණ දෙයක්. ඒක ලෝකයේ හැමතැනම තියෙන, සාමාන්‍ය දෙයක්. ඒ නිසා ඒක ගැන වික්ෂිප්ත නොවිය යුතුයි. ඇත්තටම එහෙම වෙන්නේ, නැත්නම් තමයි ප්‍රශ්නේ. ඊළඟට ඔබ ප්‍රතිරූප වන්දනාව ගැනත් ඇහුවා. මේක සුපර් ස්ටාර් වලින් පටන් ගත්ත එකක් නෙමෙයි. උදාහරණයකට සනත් ජයසූරියව ගත්තොත් එයා, 96 ලෝක කුසලාන තරගාවලියෙන් පසසේ ඇදහිය නොහැකි විදිහට ''මාකට්'' වුණා. ජයසූරිය, වීරයෙක් බවට පත්වුණා. පැහැදිලිවම වීරයෙක් වීමට තරම්, ප්‍රමාණවත් කුසලතාවයක්, යම් කෙනෙකු ප්‍රදර්ශනය කරනවා නම්, ඔහු වීරයෙක් වෙනවා. ඒ වුණත් මේ අයගේ ජනප්‍රියතාවය දීර්ඝකාලිනයි, කියලා මම හිතන්නේ නැහැ. ඒක ඉතා ලඟදිම කඩා වැටෙන්නට නියමිතයි. ඒක අපි අවංකවම පිළිගත යුතුයි. පැහැදිලිවම මේ අයට ඉදිරියට යා හැක්කේ, තමන්ගේම කියලා කුසලතාවයක් තියෙනවා නම් විතරයි. අනිවාර්යයෙන්ම මේ අයට, වෙළෙඳපොළ තුළ තරග කරන්න වෙනවා.

**චාමර ලක්ෂාන් කුමාර**